**SLPMCS**

**LIMITED**

Since 1982

# ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සේවා (පුද්ගලික) සමාගම

# ඇබෑර්තු

ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා (පෞද්ගලික) සමාගම යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැගෙනහිර පර්යන්තයේ (ECT) මෙහෙයුම් කටයුතු සඳහා පහත සඳහන් තනතුර සඳහා සේවා පැවරුම් ගිවිසුම් යටතේ සුදුසුකම්ලත් පුද්ගලයෙකු බඳවා ගැනීමට බලාපොරොත්තුවේ.

## තනතුර - ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - CHIEF OPERATING OFFICER (COO)

**බාහිර බඳවා ගැනීම්**

**අ) වේතනය**

සාකච්ඡා කොට තීන්දු කළ හැකිය.

**ආ) යෝග්‍යතාව**

**01) අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම්** : පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ ව්‍යාපාර අධ්‍යයනය/ ව්‍යාපාර කළමනාකරණය/ වරාය කළමනාකරණය/ ආර්ථික විද්‍යාව/ සැපයුම් සේවා සහ ප්‍රවාහන කළමනාකරණය/ අලෙවිකරණය/ කාර්මික ඉංජිනේරු විද්‍යාව/ සැපයුම්දාම කළමනාකරණය/ භෞතික විද්‍යාව/ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රයෙහි වරලත් සාමාජිකත්වයක් ලබා තිබීම.

**රැකියා පළපුරුද්ද** : බහාලුම් පර්යන්ත මෙහෙයුම් ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක්‍රියාකාරී පළපුරුද්දක් තිබිය යුතුය.

**නිපුණතා** :

- පර්යන්ත මෙහෙයුම් වරායේ උපාය මාර්ගික දැක්ම සමග සම්බන්ධ කිරීමේ හැකියාව සහ බහාලුම් පර්යන්ත ක්‍රියාවලීන් පිළිබඳ ගැඹුරු අවබෝධය.
- නැංගුරම් සැලසුම් කිරීම, දෙඹකර මෙහෙයුම්, අංගන භාවිතය සහ උපකරණ යෙදවීම පිළිබඳ දැනුම.
- අන්තර් මාධ්‍ය ප්‍රවාහන සැපයුම්, රේගු ක්‍රියාවලීන් ගාස්තු ක්‍රමවේද සහ පසුබිම් සම්බන්ධතාව පිළිබඳ පුළුල් අවබෝධය.
- ක්‍රියාවලීන් ප්‍රශස්ත කිරීම මගින් පිරිවැය සහ ඵලදායිතාව ඉහළ නැංවීමේ පළපුරුද්ද මෙන්ම නව මෙහෙයුම් පටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- වැඩි දියුණු කිරීම් සඳහා KPI දත්ත පුවරු සහ වාර්තා භාවිතා කිරීමට ඇති ශක්තිමත් විශ්ලේෂණාත්මක හැකියාව.
- මෙහෙයුම් අයවැය කළමනාකරණය, පිරිවැය පාලනය සහ CAPEX/OPEX සැලසුම් කිරීමේ පළපුරුද්ද.
- NAVIS , TBA Auto Store හෝ Tideworks වැනි පද්ධති පිළිබඳ හුරුපුරුදු බව
- ස්වයංක්‍රිය ද්වාර RTG, AGV, OCR, IOT සහ Digital Twin තාක්ෂණය පිළිබඳ අවබෝධය.
- වරාය ආරක්ෂක ප්‍රොටෝකෝල, පාරිසරික අනුකූලතාවය සහ ISO ප්‍රමිතීන් පිළිබඳ ගැඹුරු දැනුම.
- උප කොන්ත්‍රාත්කරුවන් ඇතුළුව විශාල සහ විවිධ වූ මෙහෙයුම් කණ්ඩායම් මෙහෙයැවීමට ඇති ඔප්පු කරන ලද හැකියාව.
- අවදානම් කළමනාකරණය, මෙහෙයුම් අර්බුද සහ ආරක්ෂක සිදුවීම් පාලනය කිරීමට ඇති හැකියාව.
- ආයතනික පරිවර්තනය, ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම, සහ ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීමට ඇති හැකියාව.
- නැව් සමාගම්, භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් සහ වරාය අධිකාරීන් සමග වැඩ කිරීමට ඇති ඉහළ හැකියාව.
- රේගුව, සමුද්‍රීය බලධාරීන් සහ ජාත්‍යන්තර වෙළඳ රෙගුලාසි පිළිබඳ මනා හුරුපුරුදු බව.
- භාණ්ඩ ඇසුරුම් කිරීම සහ මුදු, හැරීම සහ උපකරණ නඩත්තු කිරීම වැනි බාහිරින් ලබාගන්නා සේවාවන් කළමනාකරණය කිරීමේ පළපුරුද්ද.
- ප්‍රධාන විධායක නිලධාරියාගේ දැක්ම ප්‍රායෝගික මෙහෙයුම් උපාය මාර්ග බවට පත්කිරීමටත්, විවිධ කණ්ඩායම් අතර ඒකගතාවය ඇති කිරීමටත්, පාර්ශ්වකරුවන් සමග ශක්තිමත් සම්බන්ධතාවයක් පවත්වා ගැනීමටත් ඇති සන්නිවේදන හැකියාව.
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ආයෝජකයින් සහ ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් හමුවේ කරුණු ඉදිරිපත් කිරීමට ඇති දක්ෂතාවය.
- මෙහෙයුම් පිළිබඳව අවබෝධය ලබාගැනීම සඳහා Excel Power BI හෝ ERP පද්ධති වැනි මෙවලම් භාවිත කිරීමට ඇති හැකියාව.

**01) සටහන**

සෑම අයදුම්කරුවෙකුටම තනතුරට අදාළ ලිඛිත හෝ සම්මුඛ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

**02) වයස් සීමාව : අවුරුදු 60 ට අඩු**

අයදුම්පත් වයස, අධ්‍යාපන වෘත්තිය සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකවල ඡායා පිටපත් සමග **"කළමනාකාර අධ්‍යක්ෂක/ ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා පුද්ගලික සමාගම, නො.19, චෛත්‍ය පාර, කොළඹ 01"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් මෙම දැන්වීම පළ කර දින 10 ඇතුළත ලැබෙන්නට සැලැස්විය යුතුය.ඉහත තනතුර ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. තෝරාගනු ලැබුවහොත් අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තු/සංස්ථා වෙතින් අවශ්‍ය මුදාහැරීම් ලබා ගත යුතුය.

**කළමනාකාර අධ්‍යක්ෂක /ප්‍රධාන විධායක නිලධාරී.**